

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

2024

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு

Ministry of Trade, Commerce, Food Security and Cooperative Development

වාර්ෂික කාර්යසාධන වාර්තාව-2024

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

අංක 492, ආර්.ඒ.ද මැල් මාවත

කොළඹ-03

පටුන

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැදින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3 කාර්යයන් 3

1.4 සංවිධාන සටහන 4

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 5

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අරමුදල් 5

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 5

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 6

2.1 2024 .01.01 දින සිට 2024.12.31 දක්වා ප්‍රගතිය 6

2.2 විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි සැලසුම් 11

03. පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 15

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 15

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 17

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 18

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 20

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 21

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 21

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 21

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 21

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 22

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක 32

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 32

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 33

5.1 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය 33

5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 34

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 35

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 35

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 35

6.3 මානව සම්පත් සංවර්ධනය 36

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 37

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැදින්වීම

2019.12.10 දිනැති අංක 2153/12 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය ලෙස ස්ථාපිත වූ මෙම අමාත්‍යාංශය 2020.08.29 දිනැති අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා 2020.12.11 දිනැති අංක 2205/14 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වෙළෙඳ අමාත්‍යාංශය ලෙස ස්ථාපිත වූ අතර 2021.05.27 දිනැති අංක 2281/41 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය, 2022.07.22 දිනැති අංක 2289/43 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා 2022.12.22 දිනැති අංක 2311/42 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය ලෙසත් 2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය ලෙසත් ස්ථාපිත කර ඇත.

පාරිභෝගිකයින්ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරඟකාරී දේශීය වෙළෙඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම, වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් කටයුතු කිරීම, ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම, එම වෙළෙඳ ප්‍රතිපත්තිය නියාමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලාංකිකයන්ගේ එදිනෙදා පරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ජීවන තත්ත්වය ඉහළ මට්ටමකින් පවත්වාගෙනයාම සඳහා මෙම අමාත්‍යාංශය සෘජුව දායක වේ. තවද, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන සම්බන්ධීකරණය කිරීම ද මූලිකම කාර්යයකි. එසේම ආනයන හා අපනයන කටයුතු නියාමනය සඳහා දායකත්වය සැපයීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳාම ඉහළ නැංවීමටත්, විදේශ විනිමය උත්පාදනයටත්, ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරනු ලැබේ. පාරිභෝගික අයිතීන් සුරැකීම, ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම, උසස් අධ්‍යාපනය සඳහා අඩු අදායම්ලාභී පවුල් වල දරුවන්ට මුල්‍යාධාර ලබාදීම, භාණ්ඩ හා සේවා ප්‍රමිතීන් සුරැකීම හා නිවැරදි කිරුම් මිනුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපාර හා වෙනත් ආයතන ලියාපදිංචි කිරීම ආදී කාර්යයන් සඳහාද ප්‍රමුඛත්වය ලබා දී ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා සැපයීමේ හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙඳුන් හා වෙනත් සේවා සපයන්නන්ගේ සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා වෙළෙඳ අයිතීන් තහවුරු කරන දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ සබඳතා වැඩිකර ගැනීමට ද්විපාර්ශ්වීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් සඳහා එළඹීම තුළින් නව වෙළෙඳපළ අවස්ථා හිමි කරගැනීමටත්, ශ්‍රී ලාංකිකයින්ගේ එදිනෙදා පාරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ඉහළ ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමටත් දායක වීම.

අරමුණු

i. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම.

ii. වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.

iii. විවෘත තරගකාරී වෙළෙඳපොළ පරිසරයක ලංකා සතොස සමාගම, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික මට්ටමින් සමුපකාර සමිති හා සංගම් වැනි රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මහපෙන්වීම සිදු කිරීම.

iv. වෙළෙඳ ප්‍රජාව මෙන්ම පාරිභෝගිකයින්ගේද ප්‍රයෝජනය පිණිස මිණුම් ඒකක ප්‍රමිතීන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික වීම.

v. ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

vi. පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට අදාළ නෛතික කටයුතු සඳහා පාරිභෝගික සේවා අධිකාරියට අවශ්‍ය මහපෙන්වීම.

vii. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.

viii. දේශීය නිෂ්පාදනයන් හා අපනයන භාණ්ඩවල, නිසි ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාළ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමට මහපෙන්වීම.

ix. උසස් අධ්‍යාපනය සඳහා දරු දැරියන් දිරිමත් කිරීමට අදාළ සුභසාධන ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට දායකත්වය ලබාදීම.

x. ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මහපෙන්වීම.

xi. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යනු ලබන අනුකූලතා තක්සේරු ප්‍රතිඵල සේවා සහතික කිරීමට අදාළ මහපෙන්වීම.

xii. ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳපළ අවස්ථා සඳහා අපනයනකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය ආයතනික පසුබිම සකස්කරදීම හා ඒ හා සම්බන්ධිත ආයතන දිරිගැන්වීම.

xiii. අදාළ ද්විපාර්ශ්වීය, කලාපීය හා බහුපාර්ශ්වීය වශයෙන් රටවල් සමඟ ගිවිසුම්ගතවීම් වලදී පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය.

xiv. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පාද ක්‍රමය (GSP) අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් (NMTR), නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් (RTA) සඳහා අදාළ නෛතිකමය සම්බන්ධීකරණයට අවශ්‍ය මහපෙන්වීම.

1.3 කාර්යයන්

i. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වෙළෙඳ විෂයට අදාළ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම.

ii. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන්, ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

iii. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ වන ආයතන සම්බන්ධීකරණය කිරීමට කටයුතු කිරීම.

iv. පාරිභෝගිකයාගේ අයිතීන් සුරැකීම සහ අභ්‍යන්තර වෙළෙඳාම විධිමත් කිරීම සඳහා පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා වෙළෙඳපොළ තරඟකාරිත්වය ඇති කිරීම, වෙළෙඳපොළ අධීක්ෂණය, වැටලීම් කිරීම හා වෙළඳුන් හා පාරිභෝගිකයින් දැනුවත් කිරීම.


v. දේශීය වෙළෙඳපළ තුළ ඇතිවන මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම.

vi. ලෝක වෙළෙඳපොළ තුළ නව අපනයන අවස්ථා හඳුනාගැනීමට මෙන්ම නව ද්වීපාර්ශ්වීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා පිළිබඳ ගවේශණය කිරීමට ආයතන දිරිමත් කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

vii. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම හා ආර්ථික තිරසාරත්වය ප්‍රවර්ධනය කරන බුද්ධිමය දේපළ පද්ධතියක් ස්ථාපිත කිරීම.

viii. සමාගම්, ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබාදීම හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීම.

1.4 සංවිධාන සටහන



*තනතුරු අභිමිවූ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් සම්බන්ධව කටයුතු කිරීම යටතේ මෙම නිලධාරීන්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇත

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටු කරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු පහකි.

i. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
ii. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
iii. වාණිජ දෙපාර්තමේන්තුව
iv. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
v. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අරමුදල්

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටු කරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන හා අරමුදල් පහත පරිදි වේ.

i. සීමාසහිත ලංකා සතොස සමාගම
ii. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
iii. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
iv. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
v. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
vi. සමුපකාර සේවක කොමිෂන් සභාව
vii. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
viii. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන
ix. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
x. සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

1.7.1 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

අ) ව්‍යාපෘතියේ නම : බුද්ධිමය දේපළ කාර්යාලයීය කටයුතු ඩිජිටල්කරණය

ආ) දායක නියෝජිතායතනය : ලෝක බුද්ධිමය දේපළ සංවිධානය හා ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම : රු. මි. 90

ඈ) ව්‍යාපෘති කාල සීමාව : වර්ෂ 2022-2024

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2024 .01.01 දින සිට 2024.12.31 දක්වා ප්‍රගතිය

i. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යන්හි සුලභතාවය (Availability) සහ මිලදී ගැනීමේ හැකියාව (Affordability) තහවුරු කිරීම.

- වෙළෙඳපොළ තුළ පැවති බිත්තර හිඟය මඟහරවා ගැනීම සඳහා 2024 වසරේ ජනවාරි මස සිට මාර්තු දක්වා ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා බිත්තර මිලියන 56.1 ක් ආනයනය කිරීම සහ එම බිත්තර ලංකා සතොස හා සුපිරි වෙළෙඳසැල් ජාලය හරහා අලෙවි කිරීම.

- වෙළෙඳපොළ තුළ පැවති කීරි සම්බා හිඟය සහ මිල ඉහළ යාම පාලනය කිරීම සඳහා කීරි සම්බා ප්‍රභේදයට ආදේශකයක් වන GR11 සහල් ප්‍රභේදය මෙට්‍රික් ටොන් 50,000 ක් ආනයනය කිරීමට අවශ්‍ය පහසුකම් හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

- 2024 වර්ෂයේ අවසන් කාර්තුවේදී පැන නැගුන සහල් හිඟතාවය හා ඉතා ඉහළ මිල ගණන් යටතේ සහල් අලෙවි කිරීම වැලැක්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව පෞද්ගලික ආනයනකරුවන් මඟින් සහල් ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව 2024.12.02 දින සිට 2024.12.31 දක්වා කාලය තුල සහල් මෙට්‍රික් ටොන් 83,215 ප්‍රමාණයක් ආනයනය කර තිබිණි.

- ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හා ලංකා සතොස ආයතනයන් හරහා නාඩු සහල් මෙ. ටො. 70,000 ක් ආනයනය කිරීම සඳහා කටයුතු කළ අතර 2024.12.31 දින වන විට ඉන් සහල් මෙ.ටො.780 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් ආනයනය කොට ලංකා සතොස, සමුපකාර හා සුපිරි වෙළෙඳසැල් අලෙවි ජාලය ඔස්සේ බෙදාහැර ඇති අතර, තවත් මෙ.ටො.25,200 ක් සඳහා ඇණවුම් ලබා දීම සිදු කර තිබීම.

- දේශීය වෙළෙඳපොළ තුළ 2025 වර්ෂය ආරම්භයේදී ඇතිවිය හැකි යයි පුරෝකථනය කර තිබූ මේස ලුණු හිඟය වලක්වාගෙන මේස ලුණු හිඟයකින් තොරව පාරිභෝගිකයාට ලබා දීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් අයඩීන් මිශ්‍ර නොකළ ලුණු මෙට්‍රික් ටොන් 30,000 ක් ආනයනය කිරීම සඳහා 2024.12.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබීම.

- අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 19 ක් සඳහා ක්‍රම සහ විධි පිළිබඳ (Ways and Means) පාර්ලිමේන්තු කාරක සභාවේ උපදෙස් මත 2024.04.08 දින සිට සතිපතා ප්‍රකාශිත මිල ගණන් (Indicative Prices) සකස් කර එය ජනමාධ්‍ය මඟින් හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රචාරණය කිරීම.

ii. වෙළෙඳ ගිවිසුම්, අන්තර්ජාතික සම්මන්ත්‍රණ හා වෙනත් සාකච්ඡා සඳහා අමාත්‍යාංශය නියෝජනය කිරීම.

- තායිලන්ත ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ භාණ්ඩ වෙළෙඳාම (Trade in Goods) හා අදාළ සාකච්ඡා කණ්ඩායමට සහභාගී වීම.

- ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) යටතේ භාණ්ඩ වෙළෙඳාම (Trade in Goods) හා අදාළ සාකච්ඡා කණ්ඩායමට සහභාගී වීම.

- දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය (SAARC), ආසියානු සංවර්ධන බැංකුව සංවිධානය කල කලාපීය ආර්ථික ඒකාබද්ධතාවය II වන පියවර (Regional Economic Integration Study -part-II) පිළිබඳව නේපාලයේ කත්මණ්ඩු නුවර පැවැත්වූ සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වීම.

- **ලෝක වෙළෙඳ සංවිධානය (WTO):**
  ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) 13 වන අමාත්‍ය සමුළුව 2024 පෙබරවාරි 26 සිට මාර්තු 1 දක්වා අබුඩාබි හි පවත්වන ලද අතර, වෙළෙඳ ගැටළු සම්බන්ධයෙන් බහුපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී. ගරු අමාත්‍යවරයා ඊශ්‍රායලයේ වෙළෙඳ අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පවත්වන ලද අතර ෆින්ලන්තය, නෙදර්ලන්තය සහ ස්වීඩනය යන රටවල වෙළෙඳ අමාත්‍යවරුන් විසින් සත්කාරකත්වය සපයන ලද WTO නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) විසින් සපයනු ලබන සහාය පිළිබඳව අවධානය යොමු කරන ලද විද්වත් සාකච්ඡාවකට ද එක් විය.

- **උස්බෙකිස්තානය සමඟ WTO ප්‍රවේශ වීමේ සාකච්ඡා**
  ශ්‍රී ලංකාව උස්බෙකිස්තානය අතර ලෝක වෙළෙඳ සංවිධානයට උස්බෙකිස්තානය ප්‍රවේශ වීමේ සාකච්ඡා අවසන් කරන ලදී.
  ඕස්ට්‍රේලියාව-ශ්‍රී ලංකා වෙළෙඳ හා ආයෝජන රාමු ගිවිසුම කාර්තුමය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් සඳහා සහභාගී වීම.
  වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීමක් (Working Group Meeting) 2024 පෙබරවාරි 06 වන දින දෙපාර්ශ්වයේ ඉහළ මට්ටමේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මාර්ග ගත ක්‍රමයට සහභාගී විය.

iii. ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) හි ශ්‍රී ලංකාවේ නියෝජනය පිළිබඳ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාවේ ජිනීවා දූත මණ්ඩලය ලෝක වෙළෙඳ සංවිධානයේ කමිටු සාකච්ඡා සඳහා එක්වෙමින් ආහාර සුරක්ෂිතතාව, කෘෂිකර්මාන්තය, ධීවර සහනාධාර සහ සංවර්ධන ගැටළු වැනි ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ලිඛිත හා වාචික මැදිහත්වීම් 43 ක් සිදු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ඉදිරියට ගෙන යාම සඳහා ද්විපාර්ශ්වික සහ කණ්ඩායම් රැස්වීම් 25 ක් ද පවත්වන ලදී.

ද්විපාර්ශ්වික ප්‍රවර්ධන කටයුතු- ශ්‍රී ලාංකික ව්‍යාපාරවලට ස්විට්සර්ලන්තයේ අවස්ථා ගවේෂණය කිරීමට උපකාර කරමින්, මූලික වශයෙන් ධීවර, කුළුබඩු සහ සැකසූ ආහාර සම්බන්ධ අපනයන වෙළෙඳ විමසීම් 14කට මෙම මෙහෙයුම පහසුකම් සැලසීය. මීට අමතරව, "WTO විවෘත දිනය", සහ ස්විස්-ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලය පුනර්ජීවනය කිරීමේ උත්සාහයන් ඇතුළුව ප්‍රවර්ධන වැඩසටහන් 11 ක් සංවිධානය කරන ලදී.

iv. වෙළඳාම් පහසුකරණ ගිවිසුම (TFA)

2023 ජුනි මස ජනාධිපති ලේකම් කාර්යාලයේදී මුදල් අමාත්‍යාංශයේ සභාපතිත්වය යටතේ ජාතික වෙළෙඳ පහසුකරණ කමිටුවේ (NTFC) කාර්තුමය රැස්වීම් පැවැත්වීමට ගත් තීරණයට අනුව, 2024 අගෝස්තු 27 වන දින NTFC හි 01 වන සහ 02 වන කාර්තුමය රැස්වීම් පවත්වන ලදී.

2024 දී ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලෝක බැංකුව (WB) විසින් NTFC වෙත තාක්ෂණික (technical assistance) ධාරිතා ගොඩනැගීම (capacity building) පිළිබඳ සහාය ලබා දෙන ලදී. අවදානම් කළමනාකරණය සඳහා ලෝක බැංකුව ද රේගු ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව ද බොහෝ දුරට සහාය ලබා දෙන ලදී.

v. තාක්ෂණික සහාය (Technical Assistance)

ලෝක වෙළෙඳ සංවිධානයේ(WTO) සම්පත්දායකයින් සමඟ ජාතික වැඩමුළු දෙකක් පවත්වන ලදී. ඉන් පළමු වැඩමුළුව 2024 පෙබරවාරි මාසයේදී WTO හි ශාක හා සත්ත්ව ස්වස්ථතාවය පිළිබඳ ගතයුතු පියවර සම්බන්ධ ගිවිසුම පිළිබඳව සහ අනෙක් වැඩමුළුව 2024 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ වෙළෙඳ පහසුකරණ ගිවිසුම සහ එහි අනාගතය පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙම වැඩමුළු දෙකම පෞද්ගලික සහ රාජ්‍ය අංශ දෙකෙන්ම ආසන්න වශයෙන් 60 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විය 2024 මැයි මාසයේදී ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය (ITC) හි ආසියා පැසිෆික් කලාපීය නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර, ලෝක වෙළෙඳ සංවිධානයේ වෙළෙඳ පහසුකම් ගිවිසුම (TFA) ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙනුවෙන් ITC වෙතින් තාක්ෂණික ලබා ගැනීමට TFA හි තෝරාගත් කොටස් කීපයක් සම්බන්ධයෙන් ලෝක බැංකුව විසින් සපයන ලද ධාරිතා ගොඩනැගීමේ (Capacity Building) වැඩසටහන් සම්බන්ධීකරණය කරන ලදී.

vi. විදේශ වෙළෙඳපොළ ප්‍රවර්ධනය

- **වෙළෙඳ විමසුම් පිළිබඳ කටයුතු කිරීම:**
  සමාලෝචිත කාලසීමාව තුළ වාණිජ නිලධාරීන්ට වෙළෙඳ විමසීම් 481ක් ලැබී ඇති අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශ වෙළෙඳපොළ තුළ ප්‍රචලිත කිරීමේ අරමුණින් අවශ්‍ය තොරතුරු/මාර්ගෝපදේශ ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගෙන් සහ අනෙකුත් වෙළෙඳාම සම්බන්ධ ආයතනවලින් දෙපාර්තමේන්තුව වෙත ලැබුණු විමසීම් 45ක් පසු විපරම් සඳහා වාණිජ නිලධාරීන් වෙත යොමු කරන ලදී.

- **වෙළෙඳ ආරවුල් විසඳීම සඳහා සහයෝගය ලබා දීම:**
  අපනයනය සහ ආනයනය සම්බන්ධ ආරවුල් සාමකාමී අයුරින් විසඳා ගැනීම පිණිස ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන්ගේ නිරීක්ෂණ ඉල්ලමින් පැමිණිලි 45 ක් ඉදිරිපත් විය.

මතභේදයට තුඩු දී ඇති පාර්ශ්වයන් අතර සාමකාමී විසඳුමක් හරහා අපනයන හා ආනයන ආශ්‍රිත වෙළෙඳ ආරවුල් විසඳීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස වාණිජ දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. සමාලෝචිත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල විසින් එවැනි පැමිණිලි 57 ක් ගනුදෙනු කර ඇති අතර දෙපාර්තමේන්තුව වෙත සෘජුවම ලැබුණු පැමිණිලි 28 ක් සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

- **නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම:**
  වෙළෙඳ හා සේවා අංශවල විදේශිකයන් 57 දෙනෙකු සහ යැපෙන්නන් 30 දෙනෙකු සමාලෝචනය කිරීමෙන් අනතුරුව නේවාසික වීසා නිර්දේශ ලිපි නිකුත් කරන ලදී.

- **ඉන්දියාව සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) යටතේ ඇඟලුම් නිෂ්පාදන සඳහා නිකුත් කරන ලද තීරුබදු අනුපාත කෝටා සහතික:**
  කොටස් මිලියන 6.8 ක් සඳහා තීරුබදු අනුපාත කෝටා සහතික (TRQC) 2,195 නිකුත් කරන ලදී.

- **පාකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් ගිවිසුම යටතේ බාස්මතී සහල් කෝටාව සඳහා තීරුබදු අත්හැරීමේ නිර්දේශ ලිපි නිකුත් කිරීම.**
  පාකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් ගිවිසුම යටතේ බාස්මතී සහල් මෙට්‍රික් ටොන් 966ක් ආනයනය කිරීමට තීරුබදු නිදහස් කිරීමේ නිර්දේශ ලිපි 24ක් නිකුත් කරන ලදී.

vii. ප්‍රභවස්ථාන නීති ක්‍රියාත්මක කිරීම

ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම (COOs) සහ අනෙකුත් උපකාරක සේවා
ප්‍රභවස්ථාන නීති අංශය විසින් සපයනු ලබන ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම සහ අනෙකුත් උපකාරක සේවාවන් සඳහා වන සංඛ්‍යා දත්ත පහත පරිදි වේ.

නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික	**27,670**
ISFTA යටතේ කෝටා වෙන් කිරීම	2,745
වරණීය යෝජනා ක්‍රම යටතේ නව ලියාපදිංචිය	170
EU-REX ලියාපදිංචිය	51
පිරිවැය ප්‍රකාශ සඳහා අනුමැතිය	6,544
දිවුරුම් ප්‍රකාශ	1,950
සත්‍යාපනය කිරීම්	356
අපනයනකරුවන්ට විස්තර කිරීම/පැහැදිලි කිරීම	11,500
වැඩ කල දින ගණන	240
නිකුත් කරන ලද COO හි දෛනික සාමාන්‍යය	116

viii. ආහාර ද්‍රව්‍ය ආනයනකරුවන් සහ ඔවුන්ගේ සංගම් සමඟ වෙළෙඳපොළ මිල ප්‍රවණතා හා සැපයුම් සම්බන්ධව සාකච්ඡා පැවැත්වීම.

සංගමය	අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යය	දිනය
සහල්	සහල්	2024.11.18 2024.11.20 2024.11.25 2024.12.19
කිරිපිටි ආනයනකරුවන්ගේ සංගමය	කිරිපිටි	2024.03.12 2024.03.14 2024.07.13
පොල්තෙල් ආනයනකරුවන්	පොල්තෙල්	2024.07.08 2024.07.10
ටින්මාළු ආනයනකරුවන්ගේ සංගමය	ටින්මාලු	2024.04.05 2024.06.24 2024.12.23
බීලූණු ආනයනකරුවන්	බීලූණු	2024.03.12 2024.03.14 2024.03.21

ix. වෙළෙඳපොළ හා ආනයන /අපනයන තොරතුරු

- ප්‍රධාන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යන් දොළහක එනම් සහල්, තිරිඟු පිටි, සීනි, පරිප්පු, ලොකු ඵෑණු, අර්තාපල්, ටින්මාලු, කිරිපිටි, හාල්මැස්සෝ, බිත්තර, කුකුල් මස් සහ පොල්තෙල්, හා අදාළ වෙළෙඳ තොරතුරු ඇතුළත් වෙළෙඳ පැතිකඩයන් (Trade Profiles) පවත්වාගෙන යාම.

x. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යන්හි බදු සංශෝධන සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත නිර්දේශ ලබා දීම.

- දේශීය ගොවීන් ආරක්ෂා කිරීම අරමුණු කොට, ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා ආනයනික තීරු බදු සම්බන්ධයෙන් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත අවස්ථානුකූලව නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම මඟින් දේශීය ගොවීන් මෙන්ම පාරිභෝගිකයාද ආරක්ෂා කිරීම සඳහා කටයුතු සිදු කිරීම. (උදාහරණ ලෙස අර්තාපල්, ලොකු ඵෑණු හා ටින්මාළු)

- 2024 වෙළෙඳපොළ හැසිරීම අනුව ආනයනික අර්තාපල් සඳහා වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රු. 50.00 සිට රු.60.00 ඉහළ දැමීමට නිර්දේශ කිරීම. නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක අර්තාපල් සඳහා ලබා දුන් පුරෝකථන වාර්තා වලට අනුව මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 7,441 හා 5,134 ක අස්වැන්නක් 2024 වර්ෂයේදී අපේක්ෂිත බැවින් අර්තාපල් සඳහා එවකට පැවති රු.60.00 ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාතිකය 2024.12.31 දක්වා එලෙසම පවත්වා ගෙන යාම.

- 2024 දෙසැම්බර් මස 31 දිනයෙන් පැවති බදු අනුප්‍රමාණයන්ගේ වලංගු කාලය අවසන් වීම මත ටින් මාළු කි. ග්‍රෑමයට රු. 200.00 ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද 2025 දෙසැම්බර් මස 31 දක්වා දිර්ඝ කිරීමට නිර්දේශයන් ලබා දුන් අතර එම විශේෂ වෙළෙඳ භාණ්ඩ රු.450.00 දක්වා ඉහළ නැංවීම සඳහා (දේශීය ටින් මාළු කර්මාන්තය ආරක්ෂා කිරීමේ අරමුණින්) නියෝජනයන් ලබා දීම.

- 2024 ඔක්තෝබර් මස 2 වන දින ගැසට් අංක 2404/19 යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද බී ඵෑණු කිලෝග්‍රෑමයකට රුපියල් 30.00 දක්වා ඉහළ දැමීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම. (2024 ඔක්තෝබර් මස 2 වන දින සිට නොවැම්බර් 30 දක්වා බල පැවැත්විණි).

- 2024 නොවැම්බර් මස 30 වන දින ගැසට් අංක 2412/38 යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද බී ඵෑණු කිලෝග්‍රෑමයකට රුපියල් 30 සිට රුපියල් 10 දක්වා අඩු කිරීම.

xi. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ පනත යටතේ භූගෝලීය දර්ශක ලියාපදිංචිය යටතේ රෙගුලාසි සකස් කිරීමට කටයුතු කිරීම හා මැඩ්රිඩ් සංවිධාන පත්‍රය යටතේ වෙළෙඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමට අදාළව බුද්ධිමය දේපළ පනතට ඇතුළත් කළයුතු සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කරන ලදී.

2.2 විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි සැලසුම්

ජයග්‍රහණ

i. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව සාධාරණ මිලකට පාරිභෝගික ජනතාව වෙත සැපයීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත උපදෙස් හා මඟපෙන්වීම ලබාදීම නිරන්තරයෙන් සිදු කළ අතර අසාධාරණ වෙළෙඳ චර්යාවන් (Unfair Trade Practices) පාලනය කිරීම සඳහා භාණ්ඩවල ගුණත්වය පරීක්ෂා කිරීම හා පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට ලබා දීම වෙළෙඳපොළට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව ලබාදීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී උපරිම සිල්ලර මිලක් හා උපරිම තොග මිලක් නියම කිරීම හා අවස්ථානුකූලව එම මිල ගණන් ඉවත් කිරීම මඟින් පාරිභෝගික ජනතාවට සහන ලබා දීම සඳහා කටයුතු කරන ලදී.

ii. 2024 වර්ෂයේ අවසන් කාර්තුවේදී පැන නැඟුන සහල් හිඟතාවය හා ඉතා ඉහළ මිල ගණන් යටතේ සහල් අලෙවි කිරීම වැලැක්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව පෞද්ගලික ආනයනකරුවන් මඟින් සහල් ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව 2024.12.02 දින සිට 2024.12.31 දක්වා කාලය තුළ සහල් මෙට්‍රික් ටොන් 83,215 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත.

iii. ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හා ලංකා සතොස ආයතනයන් හරහා නාඩු සහල් මෙ.ටො. 70,000 ක් ආනයනය කිරීම සඳහා කටයුතු කළ අතර 2024.12.31 දින වන විට ඉන් සහල් මෙ.ටො.780 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් ආනයනය කර ලංකා සතොස, සමුපකාර හා සුපිරි වෙළෙඳසැල් අලෙවි ජාලය ඔස්සේ බෙදාහැර ඇත. තවත් මෙ.ටො. 25,200 ක් සඳහා ඇණවුම් ලබා දීම සිදු කර ඇත.

iv. 2024 වසරේ අවසාන කාලය තුළ දේශීය වෙළෙඳපොළේ ඇති වූ සහල් හා පොල් හිඟයට පිළියමක් ලෙස ලංකා සතොස අලෙවිසැල් ජාලය මඟින් මෙම ද්‍රව්‍ය පාරිභෝගිකයා වෙත සාධාරණ මිලකට අලෙවි කිරීමේ විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ලංකා සතොස සමාගම මඟින් 2024 දෙසැම්බර් සිට 2025 ජනවාරි 15 දක්වා කාලය තුළ ආනයනික සහල් කිලෝ ග්‍රෑම් මිලියන 4.5 ක් පමණ මිලදී ගෙන ඇති අතර එයින් කිලෝ ග්‍රෑම් මිලියන 1.5 ක් පමණ අලෙවි කර ඇත. 2024 සැප්තැම්බර් සිට 2025 ජනවාරි 15 දක්වා දේශීය සහල් කිලෝග්‍රෑම් මිලියන 13 ක් පමණ ද අලෙවි කර ඇත.

v. දේශීය ගොවීන් ආරක්ෂා කිරීම අරමුණු කොට, ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා ආනයනික තීරු බදු සම්බන්ධයෙන් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත අවස්ථානුකූලව නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම තුළින් දේශීය ගොවීන් මෙන්ම පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී. උදාහරණ: අර්තාපල්, ලොකු ඵණු හා ටින්මාළු

vi. දේශීය වෙළෙඳපොළ තුළ ඉදිරියේදී හිඟතාවයක් ඇතිවිය හැකි ලුණු නිෂ්පාදකයන්ගේ සංගමය තුළින් ඉදිරිපත් කළ කරුණු සඳහා මේස ලුණු හිඟයකින් තොරව පාරිභෝගිකයාට ලබා දීම සඳහා සී/ස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් අයඩින් මිශ්‍ර නොකළ ලුණු මෙ.ටො 30,000 ක් ආනයනය කිරීම සඳහා 2024.12.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

vii. ජාතික තත්ත්ව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධිත ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, සම්බන්ධීකරණය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික තත්ත්ව සභාව ස්ථාපිත කිරීම 2024.07.01 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කිරීම.

viii. නිෂ්පාදකයන්, වෙළෙඳුන් සහ පාරිභෝගික ජනතාව මුහුණපානු ලබන ප්‍රශ්න හා දුක් ගැනවිලි පිළිබඳ ලැබෙන සියලු නියෝජනයන් අදාළ ආයතන වෙතට යොමු කර ඒවාට විසඳුම් ලබා දීමට කටයුතු කිරීම හා මාර්ගෝපදේශ සැපයීම.

ix. EU GSP යෝජනා ක්‍රමය යටතේ ඉන්දුනීසියානු රෙදිපිළි භාවිතා කරමින් ඇඟලුම් අපනයනය සඳහා අන්තර් කලාපීය සමුච්චන පහසුකම.

HS පරිච්ඡේද 51 සිට 55, 58 සහ 60 යටතට ගැනෙන ඉන්දුනීසියානු සම්භවයක් ඇති රෙදිපිළි සහ ද්‍රව්‍ය භාවිතා කර EU කලාපය අරමුණු කර HS පරිච්ඡේද 61,62 සහ 63 යටතට ගැනෙන ඇතැම් රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදනය කිරීම සඳහා සහ එවැනි නිෂ්පාදන සඳහා EU GSP යෝජනා ක්‍රමය යටතේ තීරුබදු සහන සඳහා සුදුසුකම් ලබා දෙමින්, ඒ සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව විසින් කරන ලද ඒකාබද්ධ අයදුම්පතට 2024 ජූලි 09 වන දින යුරෝපීය කොමිසම හිතකර තීරණයක් ගෙන ඇත. රටවල් දෙකම GSP ප්‍රතිලාභී රටවල් ලෙස පවතින තාක් කල් මෙම සහනය දිගටම පවතිනු ඇත.

x. **ප්‍රභවස්ථාන සහතිකපත් නිකුත්කිරීමේ මාර්ගගත පද්ධතිය**
වාණිජ දෙපාර්තමේන්තුව විසින් ITC සහ GIZ හි තාක්ෂණික සහ මූල්‍ය සහාය ඇතිව, (ii)ප්‍රභවස්ථාන සහතිකපත් ඉලෙක්ට්‍රොනික නිකුත් කිරීම සඳහා දැනට පවතින ECOO පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර, පද්ධතියේ වත්මන් හිඩැස් විසඳීම සහ නව විශේෂාංග එකතු කිරීම් කරන ලදී.. මෙම ව්‍යාපෘතිය COVID-19 වසංගතයේ සන්දර්භය තුළ දියත් කරන ලද අතර, අපනයනකරුවන් මුහුණ දෙන අභියෝගවලට විසඳුම් සෙවීමත් , COOs සහ අනෙකුත් උපකාරක සේවා සැපයීම විධිමත් කිරීම සහ කඩිනම් කිරීම පද්ධතිය මගින් අපේක්ෂා කරනු ලැබේ.

xi. ශ්‍රී ලංකා වෙළෙඳ බිහිදොරෙහි (SLTIP) පියවරෙන් පියවර ක්‍රියාකාරීත්වය (SBSF) අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

xii. භූගෝලීය දර්ශක ලියාපදිංචිය සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ රෙගුලාසි පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත කර ගැනීම.

xiii. රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුව පාරිභෝගික සුභසාධනය ආහාර සුරක්ෂිතතාවය සහ ගොවීන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීම, සහතික කිරීම පිණිස වෙළෙඳපොළ මෙහෙයුම් තුළ රාජ්‍ය දායකත්වය සහතික කිරීමේදී සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව ඇවර කිරීම සම්බන්ධයෙන් වන අ.ම.ප අංක 24/1712/627/001-1 දරණ 2024.09.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉදිරි කටයුතු සිදුකිරීම වහාම ක්‍රියාත්මකවන පරිදි අත්හිටුවීම හා සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව ප්‍රතිසංවිධානය කිරීම හා මෙහෙයුම් සඳහා යොදා ගැනීමට සැලසුම් කිරීම.

අභියෝග

රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වියදම් සීමා කිරීමේ චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව කටයුතු කිරීමට සිදුවීම හේතුවෙන් සැලසුම් කරන ලද ඇතැම් වැඩසටහන්/ ව්‍යාපෘති නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

ඉදිරි සැලසුම්

i. වසර 02ක් තුළ නවීණතම අංගෝපාංග සහිත මහා පරිමාණ සහල් මෝලක් රු.බිලියන 10ක ආයෝජනයකින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

ii. ආහාර සුරක්ෂිතතාවය හා කාන්තා ව්‍යවසායකයන් බලගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි. 200ක වියදමින් කුඩා හා මධ්‍ය පරිමාණ සහල් නිෂ්පාදන ව්‍යාපෘතිය අස්වැසුම ප්‍රතිලාභී කාන්තාවන් හා තෝරාගත් ලියාපදිංචි ගොවි සංවිධාන මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

iii. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සතු ගබඩා සංකීර්ණවල වහල මත සූර්යය පැනල ව්‍යාපෘති සඳහා යෙදවීමට කටයුතු කිරීම.

iv. 2018 අංක 02 දරණ ප්‍රපාතන විරෝධී (Anti-Dumping) පනත සහ 2018 අංක 03 දරණ ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කර ඇතත් නිෂ්පාදන ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම ලෝක වෙළෙඳ සංවිධානයට දැනුම් දීම සහ වාණිජ දෙපාර්තමේන්තුවේ වෙනම ඒකකයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

v. නව ලංකා සතොස අලෙවිසැල් 150 ක් විවෘත කිරීම.

vi. නව ඒකාබද්ධ ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතියක් ස්ථාපිත කිරීම.

vii. අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය තොග අලෙවිය සඳහා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ, තොග අලෙවිසැල් 03ක් කොළඹ, මාතර හා කුරුණෑගල ආරම්භ කිරීම.

viii. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව ප්‍රතිසංවිධානය කර නව මුහුණුවරකින් නැවත තොග වෙළෙඳ කටයුතු ආරම්භ කිරීම හා සතොස සතු ගබඩා 10ක් ප්‍රතිසංස්කරණය කිරීම.

ix. නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කරමින් නිෂ්පාදන සමුපකාර 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් ආරම්භ කිරීම.

x. 2025 දී ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) බැඳීම් යටතේ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ප්‍රතිපත්ති සමාලෝචනය (TPR) පැවැත්වීම.

xi. ශ්‍රී ලංකාවේ පහත සඳහන් ද්විපාර්ශ්වික වෙළෙඳ හවුල්කරුවන් සමඟ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්/ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සභා පැවැත්වීම.

- වෙළෙඳ හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම සම්බන්ධීකරණය කිරීම.
- ඕස්ට්‍රේලියානු-ශ්‍රී ලංකා වෙළෙඳ සහ ආයෝජන රාමු ගිවිසුම (TIFA) සම්බන්ධීකරණය කිරීම.
- ඉරාන - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසම (JCEC).
- ශ්‍රී ලංකා-තුර්කි වෙළෙඳ හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසම (JCTEC).
- චීන-ශ්‍රී ලංකා ආර්ථික හා වෙළෙඳ සහයෝගිතාව පිළිබඳ ඒකාබද්ධ කමිටුව.

xii. විදේශීය වෙළෙඳපොළවල අපනයන අවස්ථා පිළිබඳව විභව සහ පවතින අපනයනකරුවන් අතර දැනුවත්භාවය ඇති කිරීම.

- විදේශීය වෙළෙඳපොළට මනාප වෙළෙඳපොළ ප්‍රවේශය සහ වෙළෙඳපොළ අවස්ථා පිළිබඳව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් කලාපීය දැනුවත් කිරීමේ වැඩසටහන් 7 ක් සංවිධානය කිරීම.
- විදේශීය වෙළෙඳපොළ අවස්ථා පිළිබඳව අපනයනකරුවන් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙබිනාර් මාලාවක් සංවිධානය කිරීම.
- 2025 ජූනි මාසයේදී චීනයේ පැවැත්වීමට නියමිත කුන්මින් (Kunming) වෙළෙඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම.

කේ. ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

03. පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	- 2023 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසීඒ1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		366,922,144	4,058,732,338	**ඒසීඒ-3**
-	තැන්පතු		50,633,393	127,708,901	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		12,806,579	12,989,100	**ඒසීඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**430,362,116**	4,199,430,339	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**430,362,116**	**4,199,430,339**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		22,336	18,204,771	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		430,339,781	4,181,225,568	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	

242,990,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	199,815,322	133,519,142	ඒසීඒ 2(ii)
285,580,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	181,975,420	122,063,505	
794,725,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	626,139,249	650,066,731	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,323,295,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,007,929,991**	**905,649,378**	
	මූලධන වියදම්				
17,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	3,252,406	5,001,306	ඒසීඒ-2(ii)
7,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	79,650	17,079	
150,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	2,452,232	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	3,803,101,128	
1,500,000	හැකියා වර්ධනය	14	971,566	363,000	
250,000,000	වෙනත් මූලධන වියදම්	15	-	30,988,606	
425,600,000	**මුළු මූලධන වියදම් (උ)**		**6,755,854**	**3,839,471,119**	
	තැන්පතු ගෙවීම්		50,322,988	125,298,048	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		21,802,543	11,799,640	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**72,125,531**	**137,097,688**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,086,811,377	4,882,218,186	
1,748,895,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(656,471,596)**	**(700,992,618)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(656,856,063)	(701,253,179)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		(384,467)	260,560	ඒසීඒ-3
			(656,471,56)	**(700,992,619)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිස්-8

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිස්-6	619,360,426	233,716,207
මූල්‍ය වත්කම්			
අන්තිකාරම් ගිණුම්	ඒසිස්-5/5(ඒ)	24,000,226	15,004,261
මුදල් හා මුදල් සමාන ද	ඒසිස්-3	384,467	260,560
මුළු වත්කම්		643,745,119	248,981,028
ඉද්ධ වත්කම් / බැඳෙන්දය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		(11,180,123)	(19,865,682)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		619,360,426	233,716,207
කුලී හා වැඩ අන්තිකාරම් සංචිතය	ඒසිස්-5(බී)	-	
ප්‍රාග්ධන වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිස්-4	35,180,348	34,869,943
අනුම ශේෂය	ඒසිස්-3	384,467	260,560
මුළු වගකීම්		643,745,119	248,981,028

පිටු අංක 7 සිට 35 දක්වා ඒසිස් 1 සිට ඒසිස් 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරතුරු සහ ඇමුණුම් පිටු අංක 36 සිට 43 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 චක්‍රලේඛනයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම් දැඩිය පරීදි වෙනස් කිරීම් සිදුකිරීමට එකින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන මූල්‍ය නිලධාරි
නම :
දිනය : 27/02/2025

ගණකාධිකාරි
නම :
දිනය : 27/02/2025

ප්‍රධාන මූල්‍ය නිලධාරි ශ්‍රීමතී ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මුදල්) කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 25/02/2025

කේ.ඒ. විමලේන්තිරරාජා
ලේකම්
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2024 **රු.**	**2023** **රු.**
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	86,022,570	66,543,637
අග්‍රිම ලැබීම්	366,922,144	4,058,732,338
වාණිජ දෙපාර්තමේන්තුව විසින් මාරු කරන ලද අතුරු අත්තිකාරම්	905,383	
2023.12.31 දිනට තිබූ අතුරු අත්තිකාරම් පියවීම	160,560	
අත්තිකාරම් අයකර ගැනීම්	12,013,240	7,054,256
තැන්පතු ලැබීම්	50,633,393	127,708,901
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**516,657,292**	**4,260,039,132**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	379,007,049	253,628,191
සහනාධාර සහ මාරුකිරීම්	69,747,228	42,279,731
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	936,350	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	22,336	18,204,771
අත්තිකාරම් ගෙවීම්	11,933,251	11,885,318
තැන්පතු ගෙවීම්	50,322,988	125,298,048
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**511,969,202**	**451,296,059**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,688,090**	**3,808,743,073**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	4,303,622	5,381,385
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,303,622**	**5,381,385**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(4,303,622)**	**(5,381,385)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**384,468**	**3,803,361,688**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	3,803,101,128
විදේශීය ණය ආපසු ගෙවීම්	-	
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**3,803,101,128**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**(3,803,101,128)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**384,468**	**260,560**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**384,468**	**260,560**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>පිළියෙල කිරීමේ අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් එකතු කිරීම අදාළ නොවේ.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම් (රු. මිලියන)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු. මිලියන)	අවසාන ප්‍රතිපාදන (රු. මිලියන)		
පුනරාවර්තන	1316	1323.29	1007.92	76.1%
ප්‍රාග්ධන	425.60	425.60	6.75	1.59%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

නැත

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.මිලියන

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2024**දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ-අරමුදල				
9152	යන්ත්‍රෝපකරණ-ශීර්ෂය	-	277,910,425.67	-	-
9153	ඉඩම්	-	341,450,000.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TAC/F/MT/2024/FS/44

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 29 දින

ලේකම්,

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය 116 - වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 116 – වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනීට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වටිනාකම රු.40,000,000 ක් වූ වාහනයක් හා ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වටිනාකම හඳුනානොගත් වාහනයක් පිළිවෙලින් පසුගිය වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයට පවරාගෙන තිබුණද මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයට අයත් නොවන එකතු වටිනාකම රු. 51,000,000 ක් වූ වාහන තුනක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පසුගිය වර්ෂයේදී අමාත්‍යාංශය යටතට ඒකාබද්ධ වූ ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන අංශයේ (වාණිජ දෙපාර්තමේන්තුවේ) වත්කම් පන්ති 07 කට අයත් එකතුව රු. 65,524,857 ක් වටිනා ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) 2025 ජනවාරි 17 දින වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු වටිනාකම රු. 84,750 ක් වූ පරිගණක ටැබ් යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර තිබීමෙන් එම ප්‍රමාණයෙන් වත්කම් වැඩියෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අවස්ථා දෙකකදී හාණ්ඩ අයිතම 18 ක් අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබුණද එම වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේදී රු. 1,193,790ක් වටිනා අයිතම 99ක් සහ වටිනාකම හඳුනා නොගත් අයිතම 50ක් වශයෙන් කාර්යාල උපකරණ අයිතම 149ක් රාජ්‍ය ආයතන 10කට නිකුත් කර තිබුණද, එම උපකරණ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කර නොතිබුණි.

1.6.2 අග්‍රිම ශේෂය

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය ඒකාබද්ධ වූ ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන අංශයේ (වාණිජ දෙපාර්තමේන්තුවේ) 2023 වර්ෂයට අදාලව රු. 1,049,227 ක් වූ නොපියවූ අග්‍රිම ශේෂය අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ රු. 905,383 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු. 143,844 ක වෙනසක් පැවතුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය තුලදී වැය විෂයයන් 17 ක් සඳහා ලබාදී තිබූ එකතුව රු. 412,500,000 ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබූ අතර වැය විෂයයන් 27 ක් සඳහා රු. 413,000,000

ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 250,621,727 ක එනම්, සියයට 31 සිට 96 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 50 අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙළ කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රු. 32,300,000 ක ප්‍රතිපාදනවලට මුදල් රෙගුලාසි 66 මඟින් රු. 11,130,000 ක අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසු රු. 43,430,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය වියදම් කිරීමෙන් අනතුරුවද එකතුව රු. 8,919,998 ක ඉතිරියක් පැවතුණි. එම ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 43 අතර පරාසයක පැවති අතර වැය විෂයයන් තුනක එකතුව රු. 2,485,310 ක් වූ ඉතිරිවීම් මු.රෙ 66 මඟින් ප්‍රතිපාදන මාරු කරගත් රු. 2,020,000 ක් වූ අතිරේක ප්‍රතිපාදන ඉක්මවා තිබූ බැවින් මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම ඵලදායී නොවුණි.

(ඇ) වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රු. 181,500,000 ක ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි 66 මඟින් රු. 23,630,000 ක් වූ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 157,870,000 ක් විය. අදාළ වියදම් දැරීමෙන් අනතුරුවද රු. 43,395,489 ක ඉතිරියක් පැවති අතර එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ත් සියයට 97 ත් අතර පරාසයක පැවතීමෙන් අධි ප්‍රතිපාදන සලසාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

වැය විෂයයන් 02කට අදාළ එකතුව රු.1,116,785ක බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නොතිබූ අතර වැය විෂයයන් 02 ක එකතුව රු. 76,306 ක් වූ බැරකම් හා බැඳීම් අඩුවෙන් දක්වා තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථාපනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට

ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1.2 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.1 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

(ඈ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, මෙම වාර්තාවේ 4.3 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**
(අ) 2017 අංක 18 දරන මෝටර් වාහන (සංශෝධිත) පනතේ 22 වගන්තිය	අමාත්‍යාංශයේ කිසිදු වාහනයක ආදායම් බලපත්‍රය වාහනවල ප්‍රදර්ශනය කර නොතිබුණි. තවද 2025 අප්‍රේල් 30 දින වන විට අමාත්‍යාංශයේ වාහන 8 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව ධාවනය කරමින් පැවතුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මූ.රෙ.104 (3) හා (4)	සමාලෝචිත වර්ෂය තුල සිදුවී තිබූ වාහන අනතුරු 4 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තා නිකුත් කර නොතිබූ අතර එක් වාහනයක අනතුර සිදු වී මාස 10ක් පමණ ගත වී ඇතත් ප්‍රාරම්භක වාර්තාව හෝ ඉදිරිපත්කර නොතිබුණි. තවද අරගලයෙන් විනාශ වූ වාහන 04 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා සකස් කිරීමට මාස 05ක පමණ කාලයක් ගත කර තිබූ අතර පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(ii) මූ.රෙ.110	අරගලයෙන් හානි වූ වාහන 2 ක් සම්බන්ධයෙන් එකතුව රු.53,290,469 ක් වූ හානි, හානි හා පාඩු ලේඛනයේ සටහන් කර නොතිබුණි.
(iii) මූ.රෙ. 571(2) හා (3)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 10,850,886 ක් වූ අවුරුදු 2 සිට 5 දක්වා පැරණි

		පොදු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 ජාතික අයවැය චක්‍රලේඛය 7.4 ඡේදය හා 2021 මාර්තු 30 දිනැති අංක අමප/21/0458/313/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය II (ආ)	2024 මැයි 02 දින අවසන් වූ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ බදු ගිවිසුම භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව 2025 පෙබරවාරි දක්වා දීර්ඝ කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු. 58,707,360ක බදු කුලී මුදලක් ගෙවා තිබුණි.
(ඈ)	2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(I)	ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සනාථ කිරීමෙන් තොරව 2022, 2023 හා 2024 වර්ෂවලදී වැටුප් හා දීමනා සහ අතිකාල ලෙස රු. 57,943,272 ක් අමාත්‍ය කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.
(ඉ)	2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 ඡේදය	අමාත්‍යාංශයේ සංචිත වාහන 3 ක් සඳහා ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි.

3.5 අවධිමත් ගනුදෙනු

අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ බිම් මහලේ ස්ථාපිත වෙළඳසැල සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වර්ග අඩි 2,178 ක ස්ථාපිත වෙළඳසැල 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා සමූපකාර තොග වෙළඳ සංස්ථාවටද 2023 අගෝස්තු සිට මේ දක්වා උමන්දාව ග්‍රීන් හට් නැමැති ආයතනයටද ව්‍යාපාර කටයුතු කරගෙන යාමට කුලියට දී තිබුණු අතර, ඒ සඳහා ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා හිඟ කුලී මුදල්, විදුලි බිල්පත් හා ජල බිල්පත් වෙනුවෙන් එකතුව රු. 6,226,669 ක මුදලක් අයවීමට තිබුණි. අවුරුදු 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණද අදාළ හිඟ මුදල් අයකර ගැනීමට සහ වෙළඳසැල හා අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් වෙන්ව ජල හා විදුලි මීටර් සවිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උක්ත වෙළඳසැලේ අභ්‍යන්තර ගෘහ නිර්මාණ කටයුතු හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 146 ක් (අධි ශීතකරණ, රූපවාහිනී, මුදල් අයකැමි යන්ත්‍ර, රාක්ක, පරිගණක) මිලදී ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව තෝරාගත් පෞද්ගලික ආයතනයකට 2021 දෙසැම්බර් 29 දින රු. මිලියන 20 ක් ගෙවා තිබුණි. එසේ වුවද එම භාණ්ඩ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව බඩු ලේඛනවල ඇතුලත් කර නොතිබුණි. තවද විගණිත දිනය වූ 2025 ජනවාරි

16 දින වනවිට එම භාණ්ඩවලින් රු. 3,293,800ක් වටිනා අයිතම 13ක් අස්ථාන ගතවී තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව උක්ත වෙළඳසැල මසකට රු. 250,000 බැගින් කුලියට දීමට ගිවිසුම්ගත වී තිබුණද, එම භූමි ප්‍රමාණය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් මාසිකව රු. 326,700 ක කුලියක් ගෙවා තිබූ බැවින් 2023 සැප්තැම්බර් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 1,627,200 ක අලාභයක් සිදු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු සමාලෝචිත වර්ෂයේදී ද ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(අ) ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම.

(ආ) අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ දත්ත පද්ධතිය පවත්වාගෙන යෑම, එම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.

(ඇ) ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීමට හා බුද්ධිමය දේපල පද්ධතියක් ස්ථාපිත කිරීම.

(ඈ) පාරිභෝගිකයා වඩාත් සුරක්ෂිත කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නීති අණපනත් යාවත්කාලීන හා සංශෝධන කඩිනම් කිරීම. (2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, 2003 අංක 36 දරන ජාතික බුද්ධිමය දේපල පනත හා 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත සේවා පනත සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංශෝධනය කර අවසන් වී නොතිබුණි.)

4.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව සියළුම ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 11 අතරින් ආයතන 04 ක 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සභාගත කර නොතිබුණු අතර ආයතන 07 ක වාර්තා මාස 04 සිට අවු 1 ½ කට වැඩි කාලයක් ප්‍රමාද කර සභාගත කර තිබුණි. තවද ආයතන 10 ක 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තා 2025 අප්‍රේල් 30 දින වන විටත් සභාගත කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) වෙනත් ආයතනවලට අයත් වාහන 21 ක් ද සමඟ 2025 මාර්තු 30 දින වන විට අමාත්‍යාංශය පරිහරණය කරන වාහන සංඛ්‍යාව 42 ක් වන අතර ඉන් රියදුරන් රහිතව අමාත්‍ය කාර්යමණ්ඩලයට අනුයුක්ත කර ඇති වාහන 10 හැර ඉතිරි වාහන 32 සඳහා අවුරුදු 02ක පමණ කාලයක සිට අනුයුක්ත කර ඇති රියදුරන් සංඛ්‍යාව 07 ක් පමණි. ඒ අනුව වාහන 20ක් පමණ ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) අරගලයෙන් හානි වූ වාහනයක් යථා තත්ත්වයට පත් කිරීම සඳහා 2023 සැප්තැම්බර් 20 දින ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබූ රු 24,000,000 ඉක්මවා රු. 52,886,217ක් වැය වන බව අදාළ සමාගම විසින් දන්වා තිබුණි. විගණිත දින වනවිට වසර 2 ½ ක පමණ කාලයක් ගතවී තිබුණද අලුත්වැඩියාව පිළිබඳ තීරණ නොගෙන රක්ෂණ මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබූ අතර වාහනය සමූපකාර තොග වෙළඳ සංස්ථාව තුල ගාල් කර තිබුණි.

4.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් 03 කට අදාල පිළිතුරු මෙම වාර්තාවේ දින වන විටත් ලබා දී නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සී/ස රාජ්‍ය වාණිජ (සමූපකාර) තොග වෙළඳ සමාගම (State Trading Co-operative Wholesale Company Ltd) නමැති රාජ්‍ය සමාගම ප්‍රසිද්ධ කර තිබුණි. එසේ වුවද අමප/21/1313/313/045 හා 2021 අගෝස්තු 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම සමාගම ඇවර කිරීමට අමාත්‍යාංශ ලේකම්ට ලබා දී තිබූ නිර්දේශය 2025 අප්‍රේල් 30 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද යථෝක්ත සමාගම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් සලසා දෙන ලද ඇපකර වෙනුවෙන් මහජන බැංකුව වෙත ගෙවීමට තිබූ 2013 මැයි 22 දිනට හිඟ මුදල් වූ රු. 31,485,686 ක් පියවීම සම්බන්ධයෙන් විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ගැනෙන ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් පවතින පොදු ගැටළුකාරී තත්ත්වයන් (මධ්‍යස්ථාන හා බදුකරුවන් විධිමත් ගිවිසුම් වලට නොඑළඹීම, වෙළඳසැල් අතුරු බදු දීම, නිසි බදවාගැනීමේ ක්‍රමවේදයක් නොමැතිවීම හා මුල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනයට ඉදිරිපත් නොකිරීම ආදී) සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමුකර නොතිබුණි.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) ඉලක්ක 3 යටතේ ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිත පවත්වා ගැනීමේ අරමුණ යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දඹුල්ල ගබඩා සංකීර්ණය ඉදිකිරීමේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 75 සිට 100 දක්වා බව සඳහන් කර තිබුණි. එළවළු හා පළතුරු ගබඩා කර කල් තබා ගැනීමේ ශීතකරණ ගබඩා සංකීර්ණ ඉදිකිරීම හා මෙහෙයුම් ක්‍රියාවලිය එහි ජයග්‍රහණ දර්ශකය ලෙස දක්වා තිබුණි. එසේ වුවද 2020 වර්ෂයේදී ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත කාල සීමාව ඉක්මවා වසර 3 ½ ක් ගතකර ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද එහි මෙහෙයුම් ක්‍රියාවලිය 2025 අප්‍රේල් අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර ආරක්ෂිත සංචිතයක් පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම දක්වා තිබුණ ද අතිරේක සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් ඇති කිරීමට ද කටයුතු කර නොතිබුණි.

6 යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව, අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකුද අමාත්‍යාංශය යටතේ ඇති එක් එක් ආයතන සඳහා එහි පාලක මණ්ඩලය විසින් ද අභ්‍යන්තර විගණකවරු පත්කර ගත යුතු වුවද 2025 ජනවාරි 31 දින වන විට අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යාපාර ආයතන 07 ක වසර 01 ත් වසර 06 ත් අතර කාල පරාසයක් අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතුණි. තවද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, සමුපකාර සේවක කොමිෂන් සභාව හා වාණිජ දෙපාර්තමේන්තුව යන ආයතන තුනෙහි අභ්‍යන්තර විගණක තනතුර ස්ථාපිත කර නොතිබුණි.

එස්.එම්.සී.ඉන්දිකා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

වැඩබලන විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව	✓		
වෙළෙඳපොළ සමතුලිතතාව	✓		
විදේශ වෙළෙඳ කටයුතු ප්‍රවර්ධනය.	✓		
ජාතික බුද්ධිමය දේපළ ආරක්ෂණය	✓		
උසස් අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය	✓		
සමාගම් හා සමිති ලියාපදිංචි කිරීම	✓		

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50-74	75-100
ඉලක්කය (1) තිරසාර ආර්ථික වර්ධනයක් ඇතිකිරීම තුළින් සහ සහනදායී මිල ක්‍රමයක් තුළින් දරිද්‍රතාව අවම කිරීමේ වැඩසටහන් අධීක්ෂණය කිරීම.	දේශීය නිෂ්පාදකයින් සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම	දේශීය ගොවීන් ආරක්ෂා කිරීම අරමුණු කොට, ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා ආනයනික තීරු බදු සම්බන්ධයෙන් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත අවස්ථානුකූලව නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම තුළින් දේශීය ගොවීන් මෙන්ම පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම. නිෂ්පාදකයන්, වෙළෙඳුන් සහ පාරිභෝගික ජනතාව මුහුණපානු ලබන ප්‍රශ්න හා දුක් ගැනවිලි පිළිබඳ ලැබෙන සියලු නියෝජනයන් අදාළ ආයතන වෙතට යොමු කර ඒවාට විසඳුම් ලබා දීමට කටයුතු කිරීම හා මාර්ගෝපදේශ සැපයීම.			✓ ✓
ඉලක්කය (2) සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම.	උසස් හා වෘත්තීය අධ්‍යාපනය ලබන දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා සඳහා දිරිමත් කිරීම.	උසස් හා වෘත්තීය අධ්‍යාපනය හදාරන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව ලබාදීම හා අනාගතේ අනාගත රැකියා වෙළෙඳපොල සඳහා වෘත්තිකයන් බිහි කිරීම.			✓

ඉලක්කය (3) ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිත පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම.	වෙළෙඳපොළ තුළ ආහාර හිඟයක් ඇතිවීම වැලැක්වීම. ආහාර ආරක්ෂිත සංචිත පවත්වාගෙන ගැනීම.	එළවළු හා පළතුරු ගබඩාකර කල්තබා ගැනීමේ ශීතාගාර ගබඩා සංකීර්ණය ඉදිකිරීම හා මෙහෙයුම් ක්‍රියාවලිය. පවත්වා ගනු ලබන ආරක්ෂිත සහල් තොග.			✓ ✓
ඉලක්කය (4) වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, එළවළු, පළතුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.	අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය තුළින් වෙළෙඳපොළ භාණ්ඩ සුලබ කිරීම.	ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1 ක ණය පහසුකම යටතේ ආනයනය කරනලද අත්‍යවශ්‍ය භාණ්ඩ. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව පාරිභෝගික ජනතාවට සැපයීම සඳහා රටතුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ඉල්ලුමට සරිලන සැපයුම පවත්වාගෙන යාමට හා මිල ගණන් ඉහළ යාමෙන් ඇතිවන තත්ත්වයන් පාලනය කර පාරිභෝගිකයාට සහන සැලසීම සඳහා විවෘත ගිණුම් යටතේ අත්‍යවශ්‍ය ආහාර වර්ග 10 ක් ආනයනයට ලබාදුන් නිර්දේශ.			✓ ✓

5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

1. රට තුළ පැවති ආර්ථික අර්බුදකාරී අවස්ථාවේ වුව ද අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය තුළින් වෙළෙඳපොළ සමතුලිතතාව ඇති කිරීමට හැකි වීම.

2. පාරිභෝගික සේවා අධිකාරියේ මැදිහත්වීම තුළ අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල අස්ථාවර වීම යම්තාක් දුරට පාලනය කළ හැකි වීම.

3. විදේශ වෙළෙඳපොළ අවස්ථා විවර කර ගැනීමට අපනයන කරුවන් දිරිගැන්වීමට හැකි වීම.

අභියෝග

1. පාරිභෝගික සේවා අධිකාරියේ අදාළ සේවාවන් සැපයීමේ දී ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති වීම.

2. මිනුම් ඒකක ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව හා බුද්ධිමය දේපළ කාර්යාලීය කටයුතු ඉටු කිරීමේ දී අවශ්‍ය තාක්ෂණික පහසුකම් අවම වීම.

3. බුද්ධිමය දේපළ කාර්යාලයේ කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	27	22	5
තෘතියික	5	2	3
ද්විතීයික	153	88	65
ප්‍රාථමික	30	25	5
තාවකාලික	4	4	0
එකතුව	219	141	78

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

මෙම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය අතරින් ද්විතියික මට්ටමේ තනතුරු 65ක් පුරප්පාඩුව පවතින අතර ඒ හේතුවෙන් අමාත්‍යාංශයේ දෛනික කාර්යයන් ඉටු කර ගැනීමේදී ද්විතියික මට්ටමේ පුරප්පාඩු නිසා කාර්ය මණ්ඩලය අපහසුතාවයට පත්වන අවස්ථාවන් උද්ගත වේ

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Diploma in Professional English - SLIDA	01	අවුරුදු 01	92,000	-	දේශීය	ඉංග්‍රීසි භාෂාව පිළිබඳව දැනුම
ප්‍රසම්පාදනය පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාව - ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය	02	දින 10	50,000	-	දේශීය	ප්‍රසම්පාදනය පිළිබඳව දැනුම
Workshop on Advance Excel for data Management - PBCA	01	පැය 04	5,000	-	මාර්ගගත	Knowledge of Advance Excel for data Management
Speech Craft Training- SLIDA	01	සති 10	35,000	-	දේශීය	Knowledge of Speech Craft
කාර්යාල ක්‍රම - SL Foundation	62	දින 02	552,000	-	දේශීය	කාර්යාල ක්‍රම පිළිබඳව දැනුම

.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	මෙම අමාත්‍යාංශයේ මෙම අත්තිකාරම් ගිණුම් නොපවතී	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.6	**වෙනත්**	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන ගිණුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8	තොග ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GA – N20) යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03	**මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ . 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූලවේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරි වරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූලවේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ . 134(2) DMA/1-2020 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2020 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කම්ප්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූලවේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූලවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූලවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූලවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූලවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූලවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූලවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූලවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූලවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූලවේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූලවේ		
12.2	හිඟහිටි ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූලවේ		
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම	අනුකූලවේ		
15.2	රැස්කර තිබූ අදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම	අනුකූලවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2004 වර්ෂය සඳහා ඉදිරිපත් කර නොමැත	2025 වසර සඳහා ලබා දීමට කටයුතු කරනු ලැබේ
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලනොවේ	2024 වර්ෂය සඳහා සකස් කර නොමැත	ක්‍රමවේදයක් සකස් කරමින් පවතී
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		රා.ප.ව.02/2018 (1) අනුව කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූලනොවේ	2024 වර්ෂයේදී පත්කර නොමැත	ඉදිරියේදී පත් කිරීමට කටයුතු කරනු ලැබේ
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	අනුකූලවේ		

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
අංක 492, ආර්. ඒ. ද. මැල් මාවත, කොලඹ 03. දූරකථනය: 0112435511 ෆැක්ස් : 0112432255
විද්‍යුත් තැපෑල: info@trademin.gov.lk

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு
இல.492 ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-03. தொலைபேசி: 0112435511 தொலைநகல்: 0112432255
மின்னஞ்சல்: info@trademin.gov.lk

Ministry of Trade, Commerce, Food Security and Co-operative Development
No 492, R A De Mel Mawatha, Colombo 03. Tel: 0112435511 Fxa: 0112432255
E-mail: info@trademin.gov.lk